# සිංහලයේ අර්ධානුනාසික්‍ය අක්ෂර
# හෙවත් සඤ්ඤක අක්ෂර

යක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

අර්ධානුනාසික්‍ය අක්ෂර සංකේතවලට සමාන්තර ව අර්ධානුනාසික්‍ය ශබ්ද තුලකයක් පිළිබඳ ව ශබ්ද විද්‍යාඥයෝ අදහස් දක්වති. එහෙත් මෙම ලිපියෙහි අරමුණ සිංහල අර්ධානුනාසික්‍ය අක්ෂර පරිණාමය පිළිබඳ ව කෙටි විග්‍රහයක් ඉදිරිපත් කිරීම ය. මෙහි දී අර්ධානුනාසික්‍ය අක්ෂර ඓතිහාසික ලේඛනවල යෙදී ඇති ආකාරය හා එහි විශේෂතා පිළිබඳ අවධානය යොමු කෙරේ.

ශබ්ද උච්චාරණයේ දී පෙණහැල්ලේ සිට එන වායු ධාරාව උච්චාරණේන්ද්‍රිය පද්ධතිය තුළ දී විවිධ බාධා කිරීම්වලට භාජනය වෙයි. එම වායු ධාරාව නාසාරන්ධ්‍රය ඔස්සේ ගමන් කිරීමෙන් නිපදවෙන ශබ්ද නාසික්‍ය ශබ්ද ලෙස සැලකෙන අතර වායු කලාපය යම් ප්‍රමාණයකට නාසාරන්ධ්‍රය හා මුඛරන්ධ්‍රය ඔස්සේ ගමන් කරවීමෙන් නිපදවෙන ශබ්ද අර්ධානුනාසික්‍ය ශබ්ද ලෙස හැඳින්වේ.

පාලි, සංස්කෘත තත්සම වචන තත්භව වශයෙන් සිංහලයට පැමිණීමේ දී ග ජ ඩ ද බ යන ඝෝෂ අල්පප්‍රාණ අක්ෂරවලට පූර්වයෙන් යෙදී ඇති ඞ ඤ ණ න ම යන අක්ෂර අර්ධ කොට ඉහත" සඳහන් ග ජ ඩ ද බ යන අක්ෂර සමග යොදනු ලැබී. අර්ධානුනාසික්‍ය හෙවත් සඤ්ඤක අක්ෂර ලෙස හඳුන්වනුයේ එම අක්ෂරයන් ය.

ඞ + ග = ඞග - ඟ - ගඟ
ඤ් + ජ = ඤ්ජ - ඦ
ණ් + ඩ = ණ්ඩ - ඬ - පඬි
න් + ද = න්ද - ඳ - බැඳ
ම් + බ = ම්බ - ඹ - අඹ

© පූජ්‍ය යක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි
සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, වොල්ෆ්ගෑන්ග් බුෂ්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.